**ආර්.ඒ. රත්නදාස එ. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1569/2019 (2020.01.21 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** ආර්.ඒ. රත්නදාස
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**
අභියාචක - ආර්.ඒ. රත්නදාස
පොදු අධිකාරිය - ඩී. ඩී. ජයමහ (සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.02.27 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම - අමුණා නැත තීරණය ලබා දුන් දිනය - ලබා දී නොමැත |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.03.12 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳ අභියාචනය ලද බව දැන්වීම - 2019.03.22 තීරණය ලබා දුන් දිනය - ලබා දී නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.05.06 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.02.27 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*මූල්‍යමය පාඩු සිදුකිරීම - මිනුවන්ගොඩ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය යන මැයෙන් යුතුව ලි.ප. අංක : 5425 යටතේ 2019.01.07 දින ඔබ වෙත එවන ලද ලිපිය හා බැඳේ.*

*එම ලිපියේ කරුණු සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ගැන තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.*

- ***i.*** *එම ලිපියේ සඳහන් කරුණු ගැන කරන ලද විමර්ශනයේ හෙළිදරව් වූ, සමිතියට සිදුව ඇති සහ සිදුවීමට ඇති අලාභය කොතෙක්ද?*
- ***ii.*** *ඒ සඳහා වගකිවයුතු නිලධාරීන් කවරෙක්ද?*
- ***iii.*** *එම අලාභය අයකර ගැනීමට කුම පියවරක් ගන්නේද?*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.03.12 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.05.06 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**නියෝගය:**

තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරයා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන අතර සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත) 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව පොදු අධිකාරියකි. එම නිසා එහි විධිවිධාන අනුව කටයුතු කිරීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට ව්‍යවස්ථාපිත වගකීමක් ඇති බව පොදු අධිකාරියට තරයේ අවධාරණය කරනු ලැබේ.

කොමිෂන් සභාව ඉදිරියේ පොදු අධිකාරිය නියෝජනය කරමින් පැමිණි සිටි නිලධාරීවරයා තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් කිසිම දැනුවත් බාවයක් නොමැති බව ද නිරීක්ෂණය වේ.

ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීමේ හැකියාව පිළිබඳව කොමිෂන් සභාවට 2020.05.05 දින හෝ ඊට ප්‍රථම දැනුම් දෙන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනයකිරීමට ද නියෝග කරනු ලැබේ.

අභියාචනය කල් තබනු ලැබේ.

මීළඟ කැඳවීම් දිනය: 2020.05.05
*****